**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ</u>**
**<u>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම.</u>**
**<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොදා ගැනීමට අනුමත ලකුණු පටිපාටිය.</u>**

**01. සේවා පළපුරුද්ද** **උපරිම ලකුණු 30**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර 05 ට නොඅඩු සතුටුදායක සේවා කාලයට අතිරේකව, 1 ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට වසරකට ලකුණු 02 බැගින් හිමි වේ. එසේම මාස 12 ක කාලයක් සඳහා පමණක් වසරකට හිමි ලකුණු සංඛ්‍යාව හිමිවන අතර ඊට වඩා අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.

**02. අධ්‍යාපන සුදුසුකම්** **උපරිම ලකුණු 10**

2.1 දර්ශනශූරි ( PhD ) - ලකුණු 10
2.2 දර්ශනපති ( M Phil ) - ලකුණු 07
2.3 පශ්චාත් උපාධිය - ලකුණු 05
2.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 03
( උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)

( කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ. තව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල/ ආයතන වෙතින් හදාරා ඇති සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන හෝ අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් අදාළ ලකුණු ලබා දෙනු ලැබේ.)

**03. ක්ෂේත්‍රයෙහි සේවා පළපුරුද්ද** **උපරිම ලකුණු 15**

(අදාළ පත්වීම් බලධාරීන් විසින් විධිමත් පරිදි සිදුකර ඇති පත්වීම් සඳහා පමණක් උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.)

3.1 පාසල් කළමණාකරණයේ පළපුරුද්ද - ලකුණු 10
( ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ අනුමත විදුහල්පති තනතුරක එක් වසරකට ලකුණු 1 බැගින්)
3.2 කාර්යාල කළමණාකරණයේ පළපුරුද්ද - ලකුණු 10
( විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ අනුමත වෙනත් තනතුරක එක් වසරකට සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින් )

**04. නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධනය** **උපරිම ලකුණු 15**

4.1 ඉටුකර ඇති පර්යේෂණ - ලකුණු 10

( පශ්චාත් උපාධියට/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර වෘත්තීය ක්ෂේත්‍රයට අදාළව ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩලයකට ඉදිරිපත් කරන ලද විධිමත්ව අවසන් කරන ලද එක් පර්යේෂණ වාර්තාවකට ලකුණු 05 බැගින් උපරිම පර්යේෂණ 02 ක් සඳහා ලකුණු දෙනු ලැබේ.)

4.2 **ප්‍රකාශයට පත් කර ඇති සඟරා , ලිපි , ප්‍රකාශන ආදිය** - ලකුණු 05

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මගින් අනුමැතිය ලද ග්‍රන්ථ සඳහා පමණක් ද පුවත්පත් හා සඟරාවල පළ කර ඇති ලිපි, වාර්තා හෝ ප්‍රකාශන සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සුදුසුයැයි තීරණය කරනු ලබන ප්‍රකාශන සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

**05. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** **උපරිම ලකුණු 05**

I. උපාධිය/ උපාධි ප්‍රධාන විෂයක්/ පශ්චාත් උපාධි - ලකුණු 05
II. මාස 06ට වැඩි සහතික පත්‍ර/ පුහුණු පාඨමාලා/ ඩිප්ලෝමා - ලකුණු 04
III. මාස 03කට වැඩි මාස 06 දක්වා සහතික පත්‍ර/ පුහුණු පාඨමාලා/ ඩිප්ලෝමා- ලකුණු 03
IV. සති 02ට වැඩි මාස 03ක් දක්වා සහතිකපත්‍ර/ පුහුණු පාඨමාලා - ලකුණු 02

**06.ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව** **උපරිම ලකුණු 05**

I. ඉංග්‍රීසි විෂය සහිත උපාධි/ ඉංග්‍රීසි මාධ්‍ය උපාධි/ ඉංග්‍රීසි මාධ්‍ය පශ්චාත් උපාධි - ලකුණු 05
II. අ.පො.ස(උ.පෙළ) ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත් වී තිබීම - ලකුණු 04
III. වසරක කාලයකට වැඩි ඩිප්ලෝමා පාඨමාලා - ලකුණු 03
IV. මාස 06 හෝ 06ට වැඩි, අවු 1ට අඩු ඩිප්ලෝමා/ සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 02
V. මාස 06ට අඩු සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 01

**07.සේවා ඇගයීම/ ප්‍රශංසා සහතික/ සම්මාන සහතික/ ජයග්‍රහන** **උපරිම ලකුණු 05**

(පොදු ආකෘතිපත්‍ර අංක 230 බී මගින් ආයතන ප්‍රධානියා විසින් ලබා දී ඇති ප්‍රශංසා /සේවා ඇගයීම සඳහා පමණක් එකකට ලකුණු 01 බැගින් උපරිම 05ක් සඳහා)

**08. ඉදිරිපත් කිරීම** **උපරිම ලකුණු 10**

ඔබගේ ආයතනයේ, (පාසල/ අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ කලාප කාර්යාලය/ කොට්ඨාස කාර්යාලය) ඔබ විසින් රාජකාරි ඉටුකිරීමේදී, අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ සිද්ධියක් පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

I. ප්‍රවේශය හා හැඳින්වීම -ලකුණු 02
II. අන්තර්ගතය -ලකුණු 02
III. කාල කලමනාකරණය -ලකුණු 02
IV. ඉදිරිපත් කිරීමේ විලාශය -ලකුණු 02
V. නිමාව හා නිගමනය -ලකුණු 02

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර ඔබ ඉදිරිපත් කරනු ලබන සිද්ධි අධ්‍යයනයට අදාළ දෘඩ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.

**09. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව** **උපරිම ලකුණු 05**